(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 1(15).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 මැයි 20 සිකුරාදා**

---

**2022 ජුනි 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2100/2022

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සහල් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සහල් ආනයනය කරන ලද ආයතනවල/සමාගම්වල නම් කවරේද;

(iv) එම සහල් ආනයනය කිරීමේදී අයකරන ලද බදු මුදල ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2114/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ සංඛ්‍යාව;

(ii) මණ්ඩලයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු මගී ප්‍රවාහන බස් රථ අතරින් මේ වනවිට අධිවේගී මාර්ගවල ධාවනයට යොදවා ඇති බස් රථ සංඛ්‍යාව;

(ii) අධිවේගී මාර්ගවල ධාවනයේ යොදවා ඇති බස් රථ මඟින් ආරම්භයේ සිට මේ දක්වා ලැබූ ආදායම සහ එම බස් රථ වෙනුවෙන් සිදු කර ඇති වියදම වෙන් වෙන් වශයෙන්;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා,— දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ යෝජනා සම්මතය,— මෙයට පෙර යෝජනා සම්මතයන් මඟින් අවසර දෙන ලද මුදලට වැඩිමනත් වශයෙන් රු.1,000,000,000,000කට නොවැඩි මුදලක් ශ්‍රී ලංකාවේදී ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ණයට ගැනීමටත්, එම කාර්යය සඳහා (417 අධිකාරය වන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2(1) වගන්තිය යටතේ අවශ්‍ය සියලුම අවසර මුදල් අමාත්‍යවරයාට දීමටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2022 ජූනි 07 අඟහරුවාදා)**

3339/2022

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය විධිමත් ලෙස ගිණුම් පවත්වාගෙන නොයෑම, අදාළ ලිපිලේඛන ඉදිරිපත් නොකිරීම සහ මූල්‍ය අසමතුලිතතා පැවතීම විගණකවරුන් විසින් පෙන්වා දී ඇති බැවින් එම සංගමයේ වංචා හා දූෂණ සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් මේ සම්බන්ධයෙන් අපක්ෂපාතී පූර්ණ විගණනයක් සිදු නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත සංගමයේ සිදු වී ඇති වංචා හා දූෂණ හේතුවෙන් එම සංගමයට හා එහි සාමාජිකයන්ට අහිමි වී ඇති මුදල ගණනය කොට එම මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් කටයුතු කරන්නේද;

(iv) ඉහත සංගමයේ සිදු වී ඇති වංචා හා දූෂණවලට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3340/2022

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් වගකීම් පැහැර හැරීම හේතුවෙන් රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය පරිහානියට පත් වෙමින් පවතින බව දන්නේද;

(ii) 1971 අංක 27 දරන පනතේ 11 වන වගන්තිය අනුව ඉහත සංගමයට නීත්‍යානුකූල ලේකම්වරයෙකු හා ගණකාධිකාරිවරයෙකු පත් නොකිරීමට හේතු කවරේද;

(iii) තනතුරු හිස්ව තැබීමේ අරමුණින් අනවශ්‍ය සුදුසුකම් සහිතව ඉහත තනතුරුවලට බඳවාගැනීමට ගැසට් නිවේදන පළ කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල කාලය 2020.06.30 දිනෙන් අවසන් වූ සංගමයේ පාලක කමිටුව විසින් තවදුරටත් මූල්‍ය හා පරිපාලන තීරණ ගැනීම නීත්‍යානුකූල නොවන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අදාළ පියවර නොගැනීමට හේතු කවරේද;

(iii) සංගමයේ ලේකම්වරයා සහ වෘත්තීය සමිති අතර 2020.10.16 දින පැවති සාකච්ඡාවේදී නිලවරණයක් පවත්වන තෙක් මූල්‍ය හා පරිපාලන කටයුතු සඳහා නිලධාරියෙකු පත් කිරීමට තීරණය කළ ද, ඒ සම්බන්ධයෙන් පියවර නොගැනීමට හේතු කවරේද;

(iv) වර්තමාන පාලක කමිටුව විසින් සංගමයේ පරිපාලන කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනමින් විශ්‍රාමිකයකු බඳවාගැනීමට හේතු කවරේද;

(v) ඉහත සංගමයේ පරිහානිය සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ජූනි 08 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2260/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ජාතික පාසල් සංඛ්‍යාව සහ පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජාතික සහ පළාත් පාසල්වල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2456/2022

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය කාලයේදී වැඩ වර්ජනවල නිරත වූ දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) පෙර දැනුම් දීමකින් තොරව සිදු කරනු ලබන එවැනි හදිසි වෘත්තීය ක්‍රියාමාර්ගවලට එරෙහිව පියවර ගැනීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2466/2022

ගරු රෝහණ දිසානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ජාතික රෝහල් සංඛ්‍යාව හා ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහල ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්කයේ නම කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ජාතික රෝහලක් හෝ ශික්ෂණ රෝහලක් ස්ථාපිත කර තිබේද;

(ii) මාතලේ දිස්ත්‍රික් රෝහල මධ්‍යම රජයට පවරා ගැනීමට අදහස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2564/2022

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ආගමික, සංස්කෘතික, සුහසාධන හා වෙනත් කටයුතුවලට භාවිතා කිරීම සඳහා එවකට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි සංස්කෘතික මධ්‍යස්ථාන 16ක් ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී අනුමතිය ලබාදී ඒ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරන ලද බවත්;

(ii) ඒ අතරින් සංස්කෘතික මධ්‍යස්ථාන 14ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද බවත්;

(iii) එහෙත් මේ වනවිට එම සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහන නතර වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රුපියල් මිලියන 20.5 ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබේද;

(ii) එම සංස්කෘතික මධ්‍යස්ථාන 16 ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2568/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා පර්යේෂණ කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන අනුමත කර ඇති විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අචාර්යවරයාගේ නම හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට මේ දක්වා එම ආචාර්යවරුන් සඳහා —

(i) අනුමත කරන ලද ප්‍රතිපාදනය;

(ii) එම ප්‍රතිපාදනයෙන් පර්යේෂණ කටයුතු කිරීම සඳහා මේ දක්වා භාවිතා කරන ලද මුදල;

(iii) අනුමත කරන ලද ප්‍රතිපාදනයෙන් භාවිතා නොකරන ලද ප්‍රතිපාදනය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පර්යේෂණ කටයුතු කිරීම සඳහා අනුමත කරන ලද මුදල, භාවිතා නොකිරීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දවන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2578/2022

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ පො. ස. (සා/පෙළ) දක්වා වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ අ. පො. ස. (උ/පෙළ) දක්වා වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුකර අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, එම එක් එක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණය අනුව සිදු කරනු ලබන ප්‍රධාන සංශෝධන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අලුතින් ආරම්භ කරන ලද ජාතික පාසල් පාලනය කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ද නොඑසේ නම්, අදාළ පළාත් සභාව විසින්ද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2633/2022

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ගෑස් පිළිබඳව සමාජ කතිකාවතක් නිර්මාණය වී ඇති බව දන්නේද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වෙළඳපොළට ගෘහස්ථ ගෑස් සපයන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමාගම් කවරේද;

(iv) එම එක් එක් සමාගමේ වෙළඳපොළ පංගුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමාගම් විසින් සපයනු ලබන ගෑස්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමට හෝ නියාමනය කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව දන්නේද;

(ii) ගෑස්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ වගකීම පැවරී ඇති ආයතන සංඛ්‍යාව හා එම ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගැස්වල ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා ඉහත සඳහන් ආයතන ශක්තිමත් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2650/2022

ගරු රවුෆ් හකීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යයන වර්ෂ 2016-2018 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් සඳහා 2021 ජනවාරි 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ආ) ශ්‍රේණියට පත්වීම් ලබාදීමේදී, ඉස්ලාම් ආගම විෂය ඉගැන්වීම සඳහා පත්වීම් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් පත්වීම්ලාභියාගේ නම, ලිපිනය සහ අනුයුක්ත කරන ලද පාසල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ජුනි 09 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2653/2022

ගරු මයන්ත දිසානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ණය ලබා ගෙන ඇති රාජ්‍ය ආයතන සහ බැංකු කවරේද;

(ii) එක් එක් වර්ෂය අනුව වර්ෂ 2010 සිට මේ දක්වා එම සංස්ථාවේ ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංස්ථාව රාජ්‍ය ආයතනවලට ලබා දී ඇති ඉන්ධන සඳහා මුදල් අයවීමට තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ආයතනයේ නම සහ අයවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2688/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් පසුගිය රජයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය මට්ටමෙන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මේ යටතේ වර්ෂ 2016 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද එක් එක් පාලම් ව්‍යාපෘතියේ නම, එය අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල, ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලද දිනය සහ එහි වර්තමාන ප්‍රගතිය කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිරියේදී පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ නම්, එම එක් එක් පාලම් ව්‍යාපෘතියේ නම, එය අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම, එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල, එහි වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත කාල වකවානුව කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2749/2022

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික්කවල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආරම්භ කරන ලද කිවුල් ඔය ව්‍යාපෘතිය සඳහා වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවල අනුමතිය ලබා දී තිබේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එළිපෙහෙළි කිරීමට අපේක්ෂා කරනු ලබන වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(iv) එම මුදල, දේශීය අරමුදල් මඟින් සපයාගනු ලබන්නේද;

(v) නොඑසේ නම්, එය විදේශ ආධාරයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ප්‍රදේශය නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ අදහස් ලබා නොගැනීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන්නි දිස්ත්‍රික්කය නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අකමැත්තක් දක්වන්නේ නම්, එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2767/2022

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනවසරයෙන් රජයේ ඉඩම් අත්පත් කරගෙන සංවර්ධනය කර ඇති පුද්ගලයන් වෙත නෛතික ලියවිලි නිකුත් කිරීම කඩිනම් කරනු පිණිස 2020.09.10 දින නිකුත් කරන ලද අංක 2192/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, ඉන් දින 12කට පසු එනම්, 2020.09.22 දින නිකුත් කරන ලද අංක 2194/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අහෝසි කරනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020.09.10 දිනැති අංක 2192/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ලැබී ඇති ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉල්ලුම්පත්‍ර අතරින් සලකා බලන ලද ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) 2020.09.10 සිට 2020.09.22 දක්වා නිකුත් කරන ලද ඔප්පු, බලපත්‍ර හා වෙනත් නෛතික ලියවිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් ඔප්පු, බලපත්‍ර හා වෙනත් නෛතික ලියවිලි නිකුත් කරන ලද එක් එක් ප්‍රතිලාභියාගේ නම, ලිපිනය හා වෙන් කර දෙන ලද ඉඩම් කොටසේ විශාලත්වය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2768/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වර්ෂයේදී බස්නාහිර පළාතේ, ආදායම් පරීක්ෂක තනතුර සඳහා බඳවාගන්නා ලද ක්‍රමවේද;

(ii) එම එක් එක් ක්‍රමවේදය සඳහා අවශ්‍ය වූ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන්;

(iii) 2015 වර්ෂයෙන් පසු, අංක 06/2006 දරන චක්‍රලේඛය අනුව බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගන්නා ලද ක්‍රමවේදය;

(iv) ඒ සඳහා අවශ්‍ය වූ අධ්‍යාපන සුදුසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අංක 06/2006 චක්‍රලේඛය අනුව 2004 වර්ෂයේදී බඳවාගන්නා ලද ආදායම් පරීක්ෂකවරුන්ගේ වැටුප් අඩුවීමක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2770/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානයේ (සාර්ක් - SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් සහ 2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙට්‍රික් ටොන් 100,000ක ආරක්ෂිත සහල් සංචිතයක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගත යුතු වුවත්, 2020 වර්ෂයේදී ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් කිසිදු සහල් සංචිතයක් පවත්වා ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත (අ) (i) හි සඳහන් පරිදි සහල් සංචිත පවත්වා ගත්තේ නම්, පුද්ගලික අංශයේ සහල් ඒකාධිකාරය බිඳ හෙළමින් සහල් සඳහා සමතුලිත මිලක් පවත්වා ගැනීමට හැකියාව තිබූ බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඉහත සඳහන් සංචිත සඳහා සහල් තොග පවත්වාගෙන යාමට සකස් කරනු ලබන සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2783/2022

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ ආරම්භ කළ කිළිනොච්චි දිස්ත්‍රික් මහජන ක්‍රීඩාංගණය ඉදිකිරීම මේ වනතෙක් සම්පූර්ණ කර නොමැති බවත්;

(ii) 2019.03.07 වන දින එහි ගෘහස්ථ ක්‍රීඩාංගණය සහ පිහිණුම් තටාකය විවෘත කළ බවත්;

(iii) මේ වනතෙක් ඒවා භාවිතය සඳහා ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම මහජන ක්‍රීඩාංගණය —

(i) ඉදිකිරීමට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) ඉදිකිරීමේදී මේ වනතෙක් භාවිතා කර ඇති මුදල කොපමණද;

(iii) ඉදිකරනු ලබන කොන්ත්‍රාත්කරුවන්ගේ විස්තර කවරේද;

(iv) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර නොතිබේ නම්, ඊට හේතු කවරේද;

(v) ඉදිකිරීමට දැව වෙනුවට රබර් පලස් භාවිතා කිරීමට හේතු කවරේද;

(vi) ඉදිකිරීම් අවසන් කර භාවිතය සඳහා ලබා දෙනු ලබන දිනය කවරේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ක්‍රීඩාංගණය ඉදිකරනු ලබන ඉඩමේ හිමිකරුවන් කවරේද;

(ii) එය ඉදිකිරීමේදී, එම ඉඩම් හිමිකරුවන්ගෙන් අවසර ලබා ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු එම ක්‍රීඩාංගණය පරිපාලනය කරනු ලබන්නේ කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

2837/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ —

(i) පදිංචිව සිටින නිවාස අවශ්‍යතා සහිත පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) පෞද්ගලික ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) ආදර්ශ ගම්මාන වශයෙන් ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2971/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය, ඉරණවිල ග්‍රාමයේ ජීවත්වන ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානයේ ජනතාව භාවිතා කරනු ලබන ධීවර තොටුපළ මේ වනවිට දැඩි මුහුදු ඛාදනයකට ලක්වී ඇති බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් පීඩාවට පත්ව සිටින ජනතාවගේ එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3077/2022

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ඇති සියලුම ආයතනවල මේ වනවිට කොන්ත්‍රාත් හා අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 ජූනි 10 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිවේගී මාර්ග ව්‍යාපෘති සඳහා අත්කර ගන්නා ලද ඉඩම් කළමනාකරණය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ඉඩම් කළමනාකරණය කිරීම සඳහා සමාගමක් ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතියක් ලබා දී තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට එම සමාගම ආරම්භ කර තිබේද;

(iv) නොඑසේ නම්, එම සමාගම ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(v) ඉහත සමාගමට ඉඩම් පවරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(vi) එම ඉඩම් පැවරීම සඳහා බලය ලැබී ඇති පනත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

40/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රන්, රිදී හා යකඩ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තකරුවන් පාරම්පරිකව ජීවත්වන ප්‍රදේශ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රදේශ අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල ජීවත්වන ඉහත කර්මාන්තවල පාරම්පරිකව නිරතවන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු පිළිබඳව අධ්‍යයනය කර තිබේද;

(ii) එසේ නම්, එම ගැටලු කවරේද;

(iii) ඔවුන්ට නව තාක්ෂණය හා පුහුණුවීම් ලබා දීමට කටයුතු කර තිබේ නම්, ඒ කෙසේද;

(iv) ඉහත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ සොයා දීමට මැදිහත් වී තිබේ නම්, ඒ කෙසේද;

(v) ඔවුන්ට විදේශ රැකියා අවස්ථා ලබා දීමට වැඩපිළිවෙළක් තිබේද;

(vi) නොඑසේ නම්, වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල්වල නම් කවරේද;

(iii) 2015 හා 2016 යන එක් එක් වර්ෂයේදී ඉහත භාණ්ඩ අපනයනයෙන් ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

256/2022

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් පෞද්ගලික බවුසර් රථ හිමියන්ගේ සංගමයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය හා ඔහුට අයත් බවුසර් රථයේ අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්ධන මිල ඉහළ යෑමට සාපේක්ෂව ප්‍රවාහන ගාස්තු සංශෝධනය නොකිරීම හේතුවෙන් ඉහත සංගමයේ සාමාජිකයන් දුෂ්කරතාවලට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

576/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම අතිශය වැදගත් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) මේ දක්වා ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) කෘෂි දත්ත ගබඩාව ස්ථාපිත කිරීමේදී යම් වංචාවක් සිදුවී තිබේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1029/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම හේතුවෙන් ජීවිත හානි සහ දේපළ හානි සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) වන අලි පහරදීම හේතුවෙන් 2019 වර්ෂයේදී සිදු වූ පුද්ගල මරණ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වන අලි පහරදීම හේතුවෙන් සිදු වන පුද්ගල මරණයක් වෙනුවෙන් මේ වනවිට ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(iii) 2019 වර්ෂයේදී වන අලි පහරදීම හේතුවෙන් සිදු වූ දේපළ හානි වෙනුවෙන් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) වන අලි පහරදීම්වලින් ජනතාව මුදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

3086/2022

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ නගරය සහ ගල්ඔය ජනපදය සම්බන්ධ කරමින් කිට්ටංගිය ගඟ හරහා පිහිටා ඇති ප්‍රධාන මාර්ගය මෝසම් වැසි කාලයේදී අඩි පහකට වඩා ජලයෙන් යට වීම හේතුවෙන් එම මාර්ගය භාවිතා කරන ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

(ii) එම මාර්ගය ඔස්සේ අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වෙත විශාල ලෙස ජනතාව ගමන් කරනු ලබන බවත්,

(iii) කිට්ටංගිය ගඟ හරහා පාලමක් ඉදිකර නොමැතිවීම හේතුවෙන් එම මාර්ගය භාවිතා කරන ලදුව අනතුරුවලට මුහුණදීම හේතුවෙන් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් මියගිය අතර දේපළ ද විනාශ වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ කිට්ටංගිය ගඟ හරහා මේ දක්වා පාලමක් ඉදිනොකිරීමට හේතුව;

(ii) ඉහත සඳහන් පාලම ඉදිකරනු ලබන දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/2022

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා විමර්ශන නිලධාරීන් 200ක් බඳවාගැනීමට 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවූ බවත්;

(ii) 2018.10.27 වන දින පවත්වන ලද බඳවාගැනීමේ විභාගයට අයදුම්කරුවන් 10,000ක් පමණ පෙනී සිටි බවත්;

(iii) විභාග ගාස්තු වශයෙන් එක් අයදුම්කරුවකුගෙන් රු.750/- ක් අය කරන ලද බවත්;

(iv) විභාගයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 408 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ බවත්;

(v) සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 200 දෙනෙකුගේ ආරක්ෂණ නිෂ්කාශන වාර්තා ලබා ගෙන ඇත ද මේ දක්වා ඔවුන් බඳවාගෙන නොමැති බවත්;

(vi) ඉහත බඳවාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර මේ වනවිට වර්ෂ 2කට අධික කාලයක් සහ එම බඳවාගැනීමට අදාළ වන කටයුතු අවසන් කර වර්ෂ 1 1/2ක පමණ කාලයක් ගත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විමර්ශන නිලධාරීන් කඩිනමින් බඳවාගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3157/2022

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1980 සිට මේ දක්වා විදේශීය රටක පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් පිළිබඳ තොරතුරු තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ශ්‍රී ලාංකිකයෙකු විදේශීය රටක පුරවැසිභාවය ලබා ගැනීමේදී ශ්‍රී ලංකාවේ රජය දැනුම්වත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද විදේශීය රටක පුරවැසිභාවය පමණක් හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද ද්විත්ව පුරවැසිභාවය හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3174/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත වුවද, එම සමිතියේ බලය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන තිබෙන බවත්;

(ii) තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු මෙයට සම්බන්ධ වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් (දකුණු පළාත) විසින් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) සීමාසහිත තංගල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ සාමාජිකයන්ගේ සහ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල්වලට වගකියනු ලබන පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3189/2022

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත ඉඩම් තිබෙන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවතින ආණ්ඩුව යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාව අතර බෙදා දුන් කොමිෂන් සභාව සතුව තිබූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත සඳහන් ඉඩම් පිහිටා තිබෙන ප්‍රදේශ කවරේද;

(iii) ඉහත සඳහන් ඉඩම් බෙදා දීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව තිබූ ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කරගනිමින් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

(iii) කොමිෂන් සභාව සතු ඉඩම් බෙදා දීමේ නව ක්‍රියාපිළිවෙළක් හඳුන්වා දී තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාපිළිවෙළ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 47/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 48/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය ස්ථාපනය කිරීම,— රජය නියෝජනය කරමින් හා ග්‍රාමීය ජනතාවට සමීපව කටයුතු කරමින් සුවිශාල මෙහෙවරක් ඉටු කරන ග්‍රාම නිලධාරින් සඳහා වූ ව්‍යවස්ථාවක් නිර්මාණය කර "ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය" ලෙස ස්ථාපනය කිරීමට නිසි පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සහනාධාර ලැබිය යුතු පුද්ගලයන්ට සමෘද්ධි සහනාධාර ලබාදීම,— සමෘද්ධිලාභින් මෙන්ම සමෘද්ධි සහනාධාර නොලබන අඩු ආදායම්ලාභි ජනතාව සම්බන්ධයෙන් විධිමත් සමීක්ෂණයක් සිදුකර සත්‍ය වශයෙන්ම සමෘද්ධි සහනාධාර ලැබිය යුතු පිරිස තෝරා ගෙන ඔවුන්ට එය ලබා දීමට සුදුසු පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම,— අධ්‍යාපන විද්‍යාපීඨවල විධිමත් ගුරු පුහුණුව අවසන් කරන්නන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සමෘද්ධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු ලබාදීම,— ග්‍රාමීය වශයෙන් තෝරාගනු ලබන අඩු ආදායම්ලාභී පවුල්වලට සමෘධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු බැගින් ලබා දී ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අපනයනය තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෘෂිකාර්මික රටක් ලෙස ගොවි ජනතාවට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් හා සේවා රජයේ මැදිහත්වීමෙන් ලබා දී ආනයනය වෙනුවට අපනයනය තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ තනතුරු සඳහා නිශ්චිත ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් මේ වනවිට සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශය සතුව තිබුණ ද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා මෙතෙක් ස්ථාන මාරුවීම් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට නොමැති හෙයින් එම නිලධාරින් අසහනයට පත්ව ඇති හෙයින් ද, එම තත්ත්වය වැළැක්විමට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා ද ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙන්ම ගුරු/ විදුහල්පති ස්ථාන මාරුවීමේ ජාතික ප්‍රතිපත්තිය ද සක්‍රීය කිරීම සඳහා රජය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු බිත්තර කර්මාන්තය නගා සිටුවීම,— වර්තමානය වනවිට කුකුළු කෑම මිල විශාල වශයෙන් ඉහළ යාම හේතුවෙන් බිත්තර කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් ගැටලුකාරි තත්ත්වයකට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වා ගෙන බිත්තර කර්මාන්තය යළි නගා සිටුවීමට රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.